| | |
|---|---|
| **කොවිඩ් 19 - සති පාසල** | |
| **2021 - තුන්වන වාරය - හයවන සතිය** | |
| **10 ශ්‍රේණිය** | **භූගෝල විද්‍යාව** |

## 6 පාඩම - ශ්‍රී ලංකාවේ කර්මාන්ත කිහිපයක ව්‍යාප්තිය, ගැටලු හා ප්‍රවණතා

**ශ්‍රී ලංකාවේ කාර්මික ඉතිහාසය, මිනිරන් කර්මාන්තය හා පිඟන් මැටි ආශ්‍රිත කර්මාන්තය (පෙළ පොත පිටු අංක 114-122)**

- ඈත අතීතයේ සිටම ශ්‍රී ලංකාව කෘෂිකාර්මික රටක් වූවද කාර්මික ක්ෂේත්‍රයේද දියුණුවක් පැවති බව ඓතිහාසික මූලාශ්‍ර මගින් තහවුරු වේ.
- නමුත් පසුකාලීනව සිදුවූ යටත් විජිතකරණය නිසා එම සාම්ප්‍රදායික දියුණුව අඩපණ විය.
- 1977න් පසු මෙරට ක්‍රියාත්මක වූ නිදහස් ආර්ථික ප්‍රතිපත්තිය අනුව, කාර්මික ක්ෂේත්‍රය තුළ පෞද්ගලික ව්‍යවසායකත්වය ප්‍රමුඛතාවට පත්විය.
- ශ්‍රී ලංකාවේ මිනිරන් කර්මාන්තයට වසර 160ක පමණ ඉතිහාසයක් ඇත.
- කාබන් ප්‍රතිශතය 97%- 99% තරම් වූ ලොව උසස්ම වර්ගයේ මිනිරන් ලංකාවෙන් හමුවීම විශේෂත්වයකි.
- මෙරට මිනිරන්වලින් 97% ක් පමණ කාර්මික අමුද්‍රව්‍යයක් ලෙස අපනයනය කරයි.
- ශ්‍රී ලංකාවේ පිඟන් මැටි කර්මාන්තය සඳහා කෙඔලින් හා බෝල මැටි ප්‍රධාන අමුද්‍රව්‍ය ලෙස භාවිත කරයි.
- මෙම මැටිවලට අමතරව පිඟන් මැටි කර්මාන්තය සඳහා යොදා ගන්නා ෆෙල්ස්පාර්, සිලිකා, ක්වාට්ස් හා කැල්සයිට් යන ඛනිජද දේශීයව ලබා ගැනීමට හැකි වීම මෙම කර්මාන්තය දියුණුවීමට හේතු වී ඇත.
- පිඟන් මැටි ආශ්‍රිත කර්මාන්තයේ දී විසිතුරු භාණ්ඩ, පිඟන් ගඩොල් හා සනීපාරක්ෂක කට්ටල නිෂ්පාදනය කරයි. දේශීය අලෙවියෙන් මෙන්ම අපනයනය මගින් ද ආදායම් උපයා ගනී.

**ක්‍රියාකාරකම**

01. ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික කර්මාන්තයන් අඩපණවීමට මුල් වූ හේතුවක් සඳහන් කරන්න.
02. නිදහසෙන් පසු මෙරට තුළ රාජ්‍ය ව්‍යවසායකත්වය යටතේ ආරම්භ වූ කර්මාන්ත පහක් නම් කරන්න.
03. මෙරටින් සොයාගන්නා ලද මිනිරන් පරිභෝජනයට හා අපනයනයට ගනු ලබන ප්‍රතිශත ලියා දක්වන්න.
04. මිනිරන් කර්මාන්තයෙහි පවතින ගැටලු තුනක් උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.
05. පිඟන් මැටි ආශ්‍රිත කර්මාන්ත සඳහා මැටිවලට අමතරව භාවිත කරන්නා වූ ඛනිජ වර්ග හතරක් ලියන්න.

06. පිඟන් මැටි ආශ්‍රිත කර්මාන්තය ශ්‍රී ලංකාව තුළ දියුණු වීමට හේතු පැහැදිලි කරන්න.

07. ශ්‍රී ලංකා ආකෘති සිතියමක ශ්‍රී ලංකාවේ මිනිරන් හා පිඟන් මැටි ව්‍යාප්ත ප්‍රදේශ ලකුණුකර නම් කරන්න.

08. මිනිරන් කර්මාන්තය හා පිඟන් මැටි ආශ්‍රිත කර්මාන්තය ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| | මිනිරන් කර්මාන්තය | පිඟන් මැටි ආශ්‍රිත කර්මාන්තය |
|---|---|---|
| ප්‍රධාන වර්ග | | |
| පැතිරී ඇති ප්‍රදේශ | | |
| නිෂ්පාදන ද්‍රව්‍ය | | |
| වැඩි වශයෙන් අපනයනය කරන රටවල් | | |
| ගැටලු | | |
| ප්‍රවණතා | | |